**සාමාන්‍ය සමය දසඅටවන ඉරුදින** | **දේව ප්‍රකාශන** 02-08-15

## පළමුවන දේව ප්‍රකාශනය

නික්මයාම 16:2-4,12-15

නික්මයාම පොතෙන් උපුටා ගත් කොටසකි.

**("මම නුඹලාට අහසින් ආහාර වස්වමි.")**

ඉශ්රායෙල් ජනයා මෝසෙස්ට හා ආරොන්ට විරුද්ධ ව පාළුකරයේ දී මැසිවිලි කියන්නට වූහ. ඔව්හු ඔවුන්ට කතා කොට, "මිසර දේශයේ දී සමිඳාණන් වහන්සේගේ අතින් අපි මැරුණෙමු නම් කොතරම් යහපත් ද? එහි දී අපට, මස් පිරුණු බඳුන් ළඟ වාඩි වී, ඇති තරම් කෑම කන්නට පුළුවන්කම තිබිණි. එහෙත් ඔබ මේ මුළු ජනතාව සාගින්නෙන් මරා දැමීමට මේ පාළුකරයට ගෙනාවහු ය"යි කීහ. එවිට සමිඳාණන් වහන්සේ මෝසෙස්ට කතා කොට මම නුඹලාට අහසින් ආහාර වස්වමි. දිනපතා මිනිසුන් නික්ම ගොස් එදිනට අවශ්‍ය කොටස එකතු කර ගත යුතු ය. මෙසේ ඔව්හු මාගේ නීතිය පිළිපදින්නෝ ද නැද්ද කියා මට ඔවුන් පරීක්ෂාකළ හැක. ඉශ්රායෙල් ජනයාගේ මැසිවිලි මට ඇසිණි, නුඹ ඔවුන් අමතමින්, 'සවස ඔබ මාංශ කන්නහු ය. උදය ඔබට ඇති තරම් රොටි ලැබෙන්නේ ය. මෙසේ නුඹලාගේ දෙවි සමිඳාණන් වහන්සේ මා බව නුඹලා දැනගන්නහු ය'යි කියන්නැ"යි පැවසූ සේක. ඉන්පසු සවස් කාලයේ දී වටවුන් වර්ගයක් අවුත් කඳවුර වසාගති. උදය කාලයේ දී කඳවුර සිසාරා පිනි තට්ටුවක් විය. පිනි වාෂ්ප වී ගිය පසු පාළුකරයේ භූමිය මතු පිට සිහින් වූ, කුඩා වටකුරු හිම වැනි දෙයක් තිබෙනු ඔව්හු දුටුහ. මෙය දුටු ඉශ්රායෙල් ජනයා එකිනෙකාට කතා කරමින්, "මෙය කුමක් දැ"යි විචාළාහ. මන්ද, ඒ කුමක් ද කියා ඔවුන් නොදත් බැවිනි. මෝසෙස් ඔවුන්ට පිළිතුරු දෙමින් "මෙය වනාහී සමිඳාණන් වහන්සේ ඔබට අනුභව කිරීමට දුන් ආහාරය වේ ය"යි කීවේ ය.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## පිළිතුරු ගීය

ගීතාවලිය 78:3-4, 23-25, 54

පිළිතුර: සමිඳාණෝ ඔවුන්ට අහසින් මන්නා වැසි වැස්වූ සේක.

ගීය: අප අසා දැනගත් දේවල් ද අපේ පියවරුන් අපට දැන්වූ දේවල් ද අපි දන්වන්නෙමු. දරු මුණුබුරන් කෙරෙන් නොසඟවා ඊළඟ පරපුරට දන්වන්නෙමු. සමිඳුන්ගේ ප්‍රබල ක්‍රියා හා බල මහිමය ද එතුමන් කළ හාස්කම් ද කියාපාන්නෙමු.

එතුමාණෝ ඉහළ අහසට කතා කළ සේක; සුරලොව දොරටු විවෘත කළ සේක. ඔවුන්ට කෑමට මන්නා වැසි වැස්වූ සේක. සගලොවින් ධාන්‍ය ප්‍රදානය කළ සේක.

දෙව් දූතුන්ගේ ආහාර පොදු ජනතාව අනුභව කළහ. එතුමාණෝ පමණටත් වඩා ආහාර පාන එවූ සේක. එතුමාණෝ තම ශුද්ධ දේශයට ඔවුන් ගෙනා සේක; තම බලයෙන් දිනාගත් කන්දට ඔවුන් ගෙනා සේක.

## දෙවන දේව ප්‍රකාශනය

එපීසි 4:17, 20-24

පාවුලු තුමන් විසින් එපීසිවරුන්ට ලියන ලද හසුනෙන් කොටසකි.

**(දෙවියන් වහන්සේගේ ස්වරූපය අනුව මවන ලද අලුත් ස්වභාවය පැළඳගන්න.)**

එබැවින්, සමිඳුණන් වහන්සේගේ නාමයෙන් මම තදින් ම ඔබට මෙසේ කියමි: පුහු අදහස් ඇති මිසදිටුවන් මෙන් තවත් නොහැසිරෙන්න. එහෙත් ක්‍රිස්තුන්

වහන්සේ ගැන ඔබ ඉගෙන ගත් දේ එවැන්නක් නොවේ. සැබැවින් ම උන් වහන්සේ ගැන ඔබ ඇසුවා පමණක් නොව, කිතුනුවන් වශයෙන් උන් වහන්සේ තුළ වූ සත්‍යය ද ඔබට උගන්වන ලදී. එබැවින් ඔබේ පසුගිය පැවැත්මට අයිති වූ තෘෂ්ණාවලින් මුළා වී විනාශ වන්නා වූ පරණ ස්වභාවය අහක දමා, ආධ්‍යාත්මික නවතාවයක් ඇති කරගන්න. දෙවියන් වහන්සේගේ ස්වරූපය අනුව මවන ලද, දැහැමිකමින් ද ශුද්ධවන්තකමින් ද ප්‍රකාශ වන අලුත් ස්වභාවය පැළඳගන්න.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## සුබසුවත් ජය නද

මතෙව් 4:4

ආලේලූයා! ආලේලූයා!
"'මිනිසා ජීවත් වන්නේ කෑමෙන් පමණක් නොව; දෙවියන් වහන්සේගේ මුවින් නික්මෙන සියලු වචන වලින් ය"යි ස්වාමින් වහන්සේ වදාරන සේක.
ආලේලූයා!

## ශුද්ධවූ සුවිශේෂය

ජොහන් 6:24-35

ජොහන් තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

**(මා වෙත පැමිණෙන යමෙක් වේ ද, ඔහුට සාගිනි නොවන්නේ ය.
මා අදහන යමෙක් වේ ද, ඔහුට කිසි කලෙකත් පිපාසය නොවන්නේ ය.)**

ජේසුස් වහන්සේ වත්, ශ්‍රාවකයන් වත් එහි නො සිටි බව සමූහයා දුටු කල, ඔව්හු ඒ ඔරුවලට නැඟී ජේසුස් වහන්සේ සොයමින් කපර්ණවුමට පැමිණියාහ. මුහුදෙන් එගොඩ දී උන් වහන්සේ හමු වී, "ගුරුදේවයෙනි, ඔබ මෙහි වැඩියේ කොයි වේලේ දැ"යි ඔව්හු ඇසූ හ. ජේසුස් වහන්සේ පිළිතුරු දෙමින්, "ඒකාන්තයෙන් මම ඔබට කියමි, ඔබ මා සොයන්නේ හාස්කම් දුටු නිසා නොව, රොටි කා තෘප්තියට පැමිණි නිසා ය. නැති වී යන ආහාරය සඳහා නොව, සදාතන ජීවනයට ඉවහල් වන ආහාරය සඳහා වීර්‍යය වඩන්න. මේ ආහාරය ඔබට ප්‍රදානය කරන්නේ මනුෂ්‍ය-පුත්‍රයාණෝ ය. පියාණන් වන දෙවියන් වහන්සේ මුද්‍රාව තබා ඇත්තේ උන් වහන්සේ මත ය"යි වදාළ සේක. එබැවින් ඔව්හු, "දෙවියන් වහන්සේගේ අභිප්‍රාය අනුව වැඩ කරන පිණිස අප කුමක් කටයුතු දැ"යි ඇසූ හ. ජේසුස් වහන්සේ පිළිතුරු දෙමින්, "දෙවියන් වහන්සේගේ අභිප්‍රාය වනුයේ, උන් වහන්සේ එවා වදාළ තැනැත්තාණන් ඔබ විසින් අදහාගැනීම ය"යි වදාළ සේක. එවිට ඔව්හු, "එසේ නම්, අප විසින් දැක අදහාගන්නා පිණිස ඔබ කවර හාස්කමක් දක්වන සේක් ද? කවර ක්‍රියාවක් කරන සේක් ද? අපේ පියවරු පාළුකරයෙහි දී මන්නා කෑහ. 'බුදින පිණිස එතුමෝ ඔවුන්ට ස්වර්ගයෙන් ආහාර සැපයූහ'යි ලියා ඇතැ"යි උන් වහන්සේට කී හ. එවිට ජේසුස් වහන්සේ, "ඒකාන්තයෙන් මම ඔබට කියමි, ස්වර්ගයෙන් ඔබට ආහාරය දුන්නේ මෝසෙස් නොවේ; ස්වර්ගයෙන් සැබෑ ආහාරය දෙන්නේ මාගේ පියාණන් වහන්සේ ය. මන්ද, දෙවියන් වහන්සේ දෙන ආහාරය වනාහි, ස්වර්ගයෙන් පහළ වී ලෝකයට ජීවනය දෙන ආහාර ය"යි වදාළ සේක. ඔව්හු ද, "ස්වාමීනි, ඒ ආහාරය නිතර ම අපට දුන මැනවැ"යි කී හ. ජේසුස් වහන්සේ කතා කොට, "ජීවනදායක ආහාරය මම ය, මා වෙත පැමිණෙන යමෙක් වේ ද, ඔහුට සාගිනි නොවන්නේ ය. මා අදහන යමෙක් වේ ද, ඔහුට කිසි කලෙකත් පිපාසය නොවන්නේ ය.

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.

ලබන ඉරුදින දේව ප්‍රකාශන සඳහා http://sinhalagospel.lk/ වෙත පිවිසෙන්න.